# දරුවන් උදෙසා බයිබලයක්

# පොහොසත් මනුෂයයා සහ දුප්පත් මනුෂයයා



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: M. Maillot; Lazarus
Alastair Paterson

සකස්කරන්නා: M. Maillot; Sarah S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර
ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

බොහෝ ආගමික නායකයන් දෙවියන් වහන්සේට වඩා
මුදල් වලට ආදරය කරන බව ජේසුස් වහන්සේ
දැනසිටි සේක. උන්වහන්සේ මනුෂ්‍යයන්
දෙදෙනෙකුට සිදුවූ දේන්, දෙවියන්
වහන්සේ නැතිව මිල මුදල් ලැබීම නිශ්ඵල
වන්නේ මන්ද කියාත් කියාදුන් සේක.
ස්වර්ගයේ සිටිනා දෙවියන් වහන්සේ
සමඟ වෙසෙන ජීවිතය
මුදල් වලට ගත
නොහැකිය.



බොහෝ වටිනා
ලස්සන ඇඳුම්
පැළඳුම් තිබූ
එක්තරා
පොහොසත්
මනුෂ්‍යයෙක්
සිටියේය. ඔහු රජ
කෙනෙකු මෙන්
ඇඳුම් ඇන්දේය.



පොහොසත් මිනිසාට හොඳින් ආහාරද තිබුනේය. සෑම කෑම වේලක්ම විශාල මංගල්‍යයය සාදයක් මෙන් වූයේය. උදේ ආහාරයට, දවල් ආහාරයට, රාත්‍රී ආහාරයට මෙන්ම ආහාර වේල් අතරතුර පවා කෑමට, ඕනෑම දෙයක් මිලදී ගැනීම පිණිස ඔහුට ඕනෑතරම් මුදල් තිබුණි.



ඒ පොහොසත් මනුෂ්‍යයාගේ ගෙදර ගේට්ටුව අසළ දුප්පත්, ලෙඩවූ, බඩගින්නේ සිටි සිඟන්නෙක් වැතිර සිටියේය. ඔහුගේ නම ලාසරුස් විය.





අසරණ ලාසරුස්ගේ ශරීරය
තුවාල වලින් පිරී තිබුනේය. ඔහුට
අසනීපයක්ද තිබෙන්නට ඇත. අන්
අය ඔහුව පිළිකුල් කළ නිසා ඔහුට
කැපුම් තුවාල පවා තිබෙන්නට ඇත.
සමහරවිට ඔහුට තුවාල ඇති වූයේ
කිරි, එළවලු, මස් වැනි ගුණදායක
ආහාර නැති නිසා විය හැකිය.

ලාසරුස්
ආහාර ගන්නට
ආශාවෙන්
සිටියේය. ඔහු
පොහොසත්
මනුෂ්‍යයාගේ
මේසයෙන්
වැටෙන ආහාර
කැබලි වලින්
සෑනසෙන්නට
ඇත.



අයාලේ යන බල්ලෝ
සමහර විට දුප්පත්
අසරණ සිඟන්නා
අසළ වැතිරුණෝය.
උන්, ඔහු
වටකරගෙන
ඔහුගේ තුවාල
ලෙවකෑවෝය.
ලාසරුස්
බඩගින්නේ සිටි
බව කිසිවෙකු
ගණන් නොගත්
බව පෙනුණි.



එක් උදෑසනක
ලාසරුස්
නින්දෙන්
නොනැගිට්ටේය.
අසරණ,
කිසිවෙකු නැති
සිඟන්නා
ඔහුගේ ජීවිතය
හැරදා ගොස්
තිබුනි. ලාසරුස්
මියගොස්
තිබුණි.



ලාසරුස් මිය ගිය මොහොතේ සිට
ඔහුගේ ප්‍රීතිය ආරම්භ විය. ආබ්‍රහම්
සමඟ සිටීමට දේවදූතයන් ඔහුව රැගෙන
ගිය බව යේසුස් වහන්සේ කී සේක. දෙවියන්
වහන්සේ ලාසරුස්ව සැනැසූ සේක.



පොහොසත් මිනිසාද මිය ගියේය. ඔහුගේ ජීවිතය බේරාගන්නට ඔහුට තිබූ මුදල් වලට නොහැකි විය. මරණය පැමිණෙන විට එය නවත්වන්නට කිසිවෙකුට පුළුවන් කමක් නැත.



පොහොසත් මනුෂ්‍යයාව වළ දැමීය. සමහරවිට එය විශාල අවමංගල්‍ය උත්සවයක් වන්නට ඇත. සමහර විට මිනිසුන් ධනවත් මිනිසා දක්ෂ හා සාර්ථක වීම ගැන ඔහුට ප්‍රශංසා කලා විය හැකිය. නමුත් ඔවුන්ගේ ප්‍රශංසා ඔහුට උපකාරයක් නොවීය. ධනවතා සිටියේ නිරයේය.



නිරයේ සිට ධනවතා කෑගැසුවේය. "ආබ්‍රහම් පියාණෙනි, ලාසරුස් එවනු මැනවි, එවිට ඔහුට ඇඟිල්ලේ අග වතුරේ ගිල්වා මගේ දිව සිසිල් කළ හැකි වන්නේය; මම මේ ගින්නෙන් පීඩා විදිමි."



“ජීවිත කාලය තුළදී ඔබට සියලු දේ තිබුණි, ලාසරුස් හට කිසිවක් නොතිබුණියැ” යි ආබ්‍රහම් පොහොසත් මිනිසාට මතක් කර දුන්නේය. “දැන් ලාසරුස් සැනසීමෙන් සිටිද්දී ඔබ පීඩා විඳින්නේය. ඔබත් අපත් අතර ඇති මහා පරතරය කිසිවෙකුට තරණය කළ නොහැක”.



“මාගේ සහෝදරයන් පස්දෙනාට
අනතුරු ඇඟවීමට ලාසරුස් යවන්නයැ”
යි පොහොසත් මනුෂ්‍යයා ආයාචනා
කළේය. “ඔවුන් මේ වධ දෙන ස්ථානයේ
නතර වෙනවාට මම අකමැති වෙමි”.



“ඔබේ සහෝදරයන්ට දෙවියන් වහන්සේගේ වචනය තිබේයැ” යි ආබ්‍රහම් පිළිතුරු දුන්නේය. සහෝදරයන් පස් දෙනා බයිබලය විශ්වාස නොකරයි නම්, ලාසරුස් මළවුන්ගෙන් නැවත පැමිණි බවද විශ්වාස නොකරනු ඇත.



ජේසුස් වහන්සේ පොහොසතා සහ ලාසරුස් ගේ කතාව කියා හමාර කල පසු, සමහරවිට ආගමික නායකයන්, “මම දෙවියන් වහන්සේට වඩා ධනයට ඇලුම් කරන්නේදැ” යි තම තමාගෙන්ම අසන්නට ඇත. දෙවියන් වහන්සේගේ වචනයට අවනත නොවුනහොත් සිදුවන දේ දැන් ඔවුහු දනිති.



# පොහොසත් මනුෂ්‍යයා සහ දුප්පත් මනුෂ්‍යයා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. ලූක් 16

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විදිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත.
ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)